

# සාරධර්ම හා සමාජය

**විජයසිරි තිලකුමාර**
බ්‍රිස්බේන්

**වත්මන් ලාංකික** සමාජය හා එහි සාරධර්'ම ලාංකික අපේ සාරධර්'ම ගැන සාකච්චා කිරීමට පෙර සාරධර්'ම යන්නෙහි අරුත ගැන යම් ඒකමිතියකට පැමිනීම යෝග්‍යයයි සිතමි. සාරධර්'ම (Morality) යනුවෙන් මා පසක් කරගන්නේ කිසියම් සමාජයක හෝ ජන කොටසක, සාමාජිකයින් විසින් කරන ක්‍රියාවන් හොඳ සහ නරක වශයෙන් විග්‍රහ කරන, සම්මතවූ ද, කාලානුරූපවූ ද නීති පද්ධතියකි. චාරිත්‍ර විධි (Ethics) යනු එම සාරධර්'ම පිලිඹිබු කරන අපේ මති මතාන්තර සහ හැසිරීම් රටාව යනුවෙන් හැඳින්විය හැකි ය. මෙම හැසිරීම් නීති පද්ධතිය පිරිහෙමින් පවතින්නේද නැතහොත් කාලානුරූපව පරිණාමය වෙමින් පවතීද යන්න තීරණය කිරීමට නම් විශ්ව සාධාරණීය වූ සාරධර්'ම පද්ධතියකට සාපේක්ෂව අපේ සාරධර්'ම වෙනස්වන්නේ කෙසේදැයි විමසිය යුතුවන්නේ ය.

ලාංකික අපේ සාරධර්'ම බිහිවී ඇත්තේ, ලාංකවේ ඇති ප්‍රධාන ආගම් වල ඇති පොදු විශ්ව සාධාරණීයයි පිලිගත හැකි මානව දයාව, සාධාරණත්වය සහ කරුණාව යන ගුණාංග පාදක කරගෙන බව පිලිගත හැකියයි විශ්වාස කරමි.

අද සමාජය තුල මිනිසාතුල ඔඩු දුවමින් ඇති අන්ධ භක්තිය නම් වු පිලිලය නිසාවෙන් ආගම ලෙස දහසකුත් මිත්‍යාමත ක්‍රියාත්මක වශයෙන් ඇදහුවද, ලෝක පූජිත දර්'ශණවාදීන් ලෙස සැලකිය හැකි බුදුන් වහන්සේ, ජේසුතුමා සහ මොහොමද් තුමා යන ආගම් නායකයන් ගේ දේශණාවල මූලික පදනම වූයේ මානව දයාව, සාධාරණත්වය සහ කරුණාව යන ගුණාංග බව පැහැදිලිය. සාරධර්'ම ගැන ඇති අපේ සහජ ඥානය සාධාරණීකරනය කරන ඉහතකී ගුණාංග, සහ ඒවායේ මූලාශ්‍රයවූ ආගම්, දර්'ශණවාදුයේ මූලික ප්‍රශ්ණ වලට පිලිතුරු සපයන අතර එම සාරධර්'ම පද්ධතියන් පුද්ගල නිශ්‍රිත ද නැතහොත් විෂය නිශ්‍රිත ද යන්නේදැයි යන පැණයටද පිලිතුරු සපයන්නේයයි හැඟේ.

සාරධර්'ම යන්නෙහි අර්'ථ නිරූපනය කරන සහ හොඳ නරක තීරණය කරන්නේ කෙසේදැයි සාකච්චාවට යොමුකරන නොයෙකුත් සිද්ධාන්ත දර්'ශණවාදීන් විසින් වරින්වර ඉදිරිපත් කර ඇති නමුත් ඉහතකී නිරපේක්ෂීයවූ ගුණාංග හැරුනවිට ඔනෑම සමාජ කණ්ඩායකමකමට අයිති සාරධර්'ම පද්ධතියන්හී පවතින අනෙකුත් රීතීන් ගෙන් බොහොමයක් සාපේක්ෂයයි හැඟෙන අතර කාලානුරූපව පරිණාමය වෙමින් පවතීයයි විශවාස කරමි. මුස්ලිම් සමාජයේ පවතින බහු භාර්'යා සේ-වනය, ඉංදියාවේ පැවති සති පූජාව, ලංකාවේ පැවති එකගෙයි කෑම වැනි සිරිත් අද ක්‍රියාත්මක නොවෙමින් හෝ අභාවයට ගොස් ඇතත්, කාලීන සන්ධර්'භය තුල එම සිරිත් සාධාරණීය වීයයි, කෙනෙකුට තර්'ක කල හැකි වුවද, කිසියම් සමාජයකට හෝ ජන කොටසකට අයත් සාරධර්'ම පද්ධතියක ඇතුලතම සිදුවන සිරිත් හී පරිණාමය පසු ගමනක්ද නැතහොත් පෙරගමනක්දැයි නිරාකරනය කරනොගත හොත් අප නිරායාසයෙන්ම ශූන්‍යතාවාදය අදහනන් බවට පත්වනු ඇත. මෙම ගැටලුවෙන් මිදීමට ඇති එක් ක්‍රමයක් වන්නේ, දහඅටවන සියවසේ ජීවත්වුන ජර්'මානු ජාතික දර්'ශණවාදියෙකු වූ එම්මානුවෙල් කාන්ට් පැවසූ පරිදි නිරපේක්ෂීයවූ ද, අනිවාර්'යවූ ද, විශ්ව සාධාරණීයවූ ද සාරධර්'ම ඇතැයි පිලිගැනීමය. මෙසේ පිලිගත හැකි සාරධර්'ම සෑම ආගමකම පාහේ ගැබ්වී ඇති අතර එයින් සමහරක් උපුටා දැක්වීම මැනවියයි සිතමි.

බුද්ධාගමෙහි උගන්වන ඔබට වේදනාකරීවන කිසිවක් අන්කිසිවකුට නොකරන්න (උදාන වග්ග), අන් කිසිවකු විසින් කරන ක්‍රියාවක් මට සතුට නොදෙන්නේනම් හෝ වේදනා දෙන්නේ නම් එම ක්‍රියාව මම අන් කිසිවකුට කරන්නේ කෙසේද (සම්යුත්ත නිකාය). හින්දු ආගමෙහි, ඔබට වේදනා පමුනුවන යමක් අන් කිසිවකුට නොකරන්න (මහාභාරත) යයි උගන්වති. යුදෙව් ආගමෙහි ඔබේ සිතේ වෛරය උපදවන යමක්, ඔබේ අසල්වැසියාට නොකරන්න (තල්මූඩ්, සබාත්) යයි පැවසේ. ඉහත දැක්වූ අදහස් ඇති පාඨ ක්‍රිස්තියානි ආගමේ (ලියුක්) ජයින ආගමේ (මහාවිහාර), භායි හා කොන්පියුසස් ආගමේ (අනෙලෙක්ට්ස්) ද දැකිය හැක.

මෙම විශ්ව සාධාරණීයයි සැලකිය හැකි මානව දයාව, සාධාරණත්වය සහ කරුණාව යන මූලික ගුණාංග මත බිහිවූ සාරධර්'ම වලට සාපේක්ෂව අපේ සාරධර්'ම පිරිහෙමින් පවතින්නේද නැතහොත් ඉදිරිය කරා ගමන් කරත්දැයි විමසිය හැකි ය. මෙහිදී පොදුවේ ලාංකික සමාජය ඒ''කකයක් ලෙස ගෙන සැලකීම පමණක් ප්‍රමාණවත් යයි නොසිතමි. සමාජය සෑදී ඇති එක් එක් පුද්ගලයා, එම සමාජය තුල සම්මත චාරිත්‍ර විධි උකහා ගන්නේ කෙසේදැයි අධ්‍යයණය කිරීමද මෙහිලා උපකාරීවනු ඇත.

හාවර්'ඩ් විශ්ව විද්‍යාලයේ මහාචාර්'යවරයකුව සිටි ලෝරන්ස් කෝල්බර්'ග් (1927-1987) තම ආචාර්'ය උපාධිය සඳහා කල අධ්‍යයණය හා එහි ප්‍රතිපල, පුද්ගලයකු සාරධර්'ම උකහා ගන්නා අන්දමත් සාරධර්'ම අතින් දියුනු අදියරයන්ට පා නගන අයුරුත් පැහැදිලි කරයි. ඔහු මෙම ක්‍රියාවලිය ප්‍රධාන අදියර තුනකින් සිදුවන බවත්, එම සෑම මූලික අදියරයක්ම පියවර දෙකකින් සමන්විත බවත් පැහැදිලි කලේය. එහි පෙර-සම්ප්‍රදායානුකූල අදියර වශයෙන් නම්කල හැකි මූලික අදියර අනුව, දඬුවම, කීකරුකම හා තෑගි උපයෝගී කරගත් චාරිත්‍ර විධි පුහුණුව හුදෙක් කුඩා දරුවන් ගේ මට්ටමට කෙනෙකුගේ සාරධර්'ම වර්'ධනය කරවයි. දෙවන, සම්ප්‍රදායානුකූල අදියර වශයෙන් නම්කල හැකි මට්ටමේදී උපයෝගී වන්නේ හොඳ පුරවැසිකම හා නීතිගරුක බවයි. තුන්වන අදියර වන පසු-සම්ප්‍රදායානුකූල මට්ටමේ ප්‍රථම පියවර පැහැදිලි කරන්නේ උපයෝගීතාවාදයයි. එනම් කිසියම් ක්‍රියාවක හොඳ ප්‍රතිඵල උපරිම කිරීමේත් නරක ප්‍රතිඵල අවම කිරීමේත් සිද්ධාන්තයයි. මෙම මට්ටමට ලඟාවූ තැනැත්තා සමාජයේ අන් පුරවැසියනට හා පොදුවේ සමාජයට හානි නොවන අයුරින් තම නිදහස භුක්තිවිඳීමට දනී. මෙම තුන්වන අදියරෙහි දෙවන පියවරට ලඟාවූ තැනැත්තා විශ්ව සාධාරණීය පරමාදර්'ශයන්ගෙන් යුක්ත වන අතර එම සාධාරණීයත්වය වෙනුවෙන් නීති කඩකිරීමකට උවද පෙලඹේ. මෙවන් පුද්ගලයන් විරල වන අතර, මහත්මා ගාන්ධි, තෙරේ'සා මව් තුමිය හා මාටින් ලූතර්' කිං අදීන් මේ ගනයට වැටේ.

අයි. එම්. ආර්. ඊරියගොල්ල මහතා පරිවර්'තනය කල මනුතාපයේ එන ජනවර්'ජන මෙන්, කිසියම් දුප්පත් මිනිසකු තම බිරිඳගේ ලෙඩට බෙහෙත් ගැනීමට මුදල් නැතිකමින්, බෙහෙත් සොරකම් කල හොත් එය නිවැරදිදැයි මෙම තුන් අදියරේ'ම පුද්ගලයන්ගෙන් කෝල්බර්'ග් ප්‍රශ්ණ කල විට ලැබුන පිලිතුරු මිනිසුන්ගේ සාරධර්'ම පිලිබඳ ඇති නුවණ හා ඔවුන් ලබාඇති සාරධර්'ම වර්'ධනයේ අදියරයන් පැහැදිලිව පෙන්වීය.

ඩේවිඩ් කෑෂ් සහ ජෙරමි ස්ට්‍රොමේයර්' නම් දෙදෙනකු එක් දහස් නමසිය අනූඅටේ සැප්තැම්බර්' මස දිනකදී ඇමෙරිකාවේ නෙවේඩා හිදී සත් වයස් දැරියක සමග කථා කරමින් සිටි අතර, පසුව ජෙරමි මෙම දැරිය දූෂණය කර ඩේවිඩ් ඉදිරියේම මරා දැමූ අතර ඩේවිඩ් එය වැලක්වීමට කිසිදු පියවරක් නොගත්තේය. පසුව පැවති නඩු විභාගයේදී ජෙරමි වරදකරුවූ නමුත් ඩේවිඩ් නිදහස් විය. නිදහසට හේතුව වුයේ අපරාධයක් නොවැලක්වීම නීතියට පටහැනි නොවීමයි. මෙහිදී පැහැදිලි වනුයේ සාරධර්'ම නීතිය අභිභවා යන අවස්ථාවකි. මෙතෙක් මා සාකච්චා කිරීමට උත්සාහ කලේ සාරධර්'ම යනු කුමක්ද යන්නත්, එය මැනීම සඳහා උපයෝගී කරගත හැකි මිනුම් දඬුවක් සහ ඒක පුද්ගල සාරධර්'ම මට්ටමුත් පමණි. අප සමාජය පුරා පැතිරී සිටින බල්ලන් මරා හෝ මුදල් සෙවීමත්, මුදලට පමනක් මුල්තැන දීමත් ආත්මාර්'ථකාමී භාවයත් සලකා ලාංකික අප සාරධර්'ම අතින් පිරිහෙමින් පවතින්නේද යන්න තීරණය කිරීම පාඨක ඔබට බාරය. ■




# නංගිට බැඳපු මල් වියනයි

සිසිර දිසානායක

සේනානයක වේරලියද්ද මෑත යුගයේ හෙළ ගී රසිකයන් අතර ජනප්‍රියත්වයෙන් කෙහෙළි නැංවූ නමක්. අපගේ ප්‍රෞඪ ඉතිහාසය පුරාවට පැතිර ගිය සිංහල පෞර්ෂත්වය කදිමට විදහාපානා ගැඹුරු ගැමි කටහඬක්. පාරම්පරික නර්තන හා භේරි වාද්‍ය හැකියාවන්ගෙන් වේදිකාව උචිත වන සේ ඉදිරිපත් කෙරෙන නවතම ප්‍රසාංගික කලාවක්.

පසුගිය දා ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ආදි ශිෂ්‍ය සංගමය විසින් ඉදිරිපත් කරන ලද ගිම්හාන ගී ප්‍රසංගයේ



පෙරහුරුව අවසන සන්නස ලැබුවා ය ඉසිඹුවක් සේනානයක සමඟ මුසු වන්නට.

යමු ටිකක් එළියට.. හුළං ටිකක් වදින්නත් එකක්.. ගමේ කමට ගහ කොළට පෙම් බැඳි වේරේ නැවතුනේ ශාලාවෙන් පිටත තුරු සෙවණක් යට වූ ආසනයක් අසළ.

මගේ ගම අව්කන.. දුටුවැව.. දිවයිනේ ඓතිහාසික ගමක නමක්. දුටුවැව සරසවි කලායතනය පවත්වාගෙන ගියේ මගේ පියාත් අයියාත්. ඉතින් පාරම්පරික නැටුම්, බෙරවාදන වගේ දේවල් උප්පත්තියෙන්ම ඇඟට කාවැදිලයි තිබුණෙ. කලායතනය නිසා ඒ දේවල් කුඩා කාලයේ ඉඳලම වැඩි දියුණු වුණා.

80 දශකයේ මුල් හරියේ දී ගමේ ඉඳලා ආමා මං රාජ්‍ය නැටුම්

23 පිටට

Raigam

2006

සුබ නව වසරක් වේවා!

Wish you a Very Happy & Prosperous New Year !

මේ සුබ පැතුම්

THE KINGDOM OF RAIGAM®

21 වන සියවසේ දේශීය සමාගම

www.raigam.lk

Sri Lanka

&

E-Techno Enterprises Australia

රයිගම් නම් කවදත් කොතැනත් හරිම රසයි!

Wholesale & Customer Service 03-9700 2100 & 03-93703813 Fax: 03-9337 9468

Sole Agents in Australia & New Zealand:
E-Techno Enterprises, PO Box 87, VIC 3039
Email:sales@etechno.com.au